**ශීර්ෂ 110 - අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 02 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේසාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ., ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇතවංචා සහ වැරදි තනි හෝ සාමූහි .ක ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්රමිති ප්‍රකාරව විගණනය කරන ලදී,මා විසින් තවදුරටත් .

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී . කාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා ප්‍රමාණාත්මක සාවද්‍යාවරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍ර ,ජ ලේඛන සැකසීමවාා ,බල වන්නේ දුස්සන්ධානයවංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍ර වරදවා දැක්වීමෙන් හෝ අභ් ,චේතනාන්විත මගහැරීමෙන්යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවදන්තර පාලනය අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍ය , .පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවයගිණුම්කරණ ඇස්තමේන්තුවල , .සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී .

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

**(ආ)** ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය සතු වාහන 03 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබූ අතර වෙනත් ආයතන වෙත විධිමත්ව පවරා දී තිබූ වාහන 12 ක එකතු වටිනාකම රු.34,200,000 ක් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | වත්කම් වටිනාකම නිවැරදි කළ යුතු වේ. | වාහන 02 ක වටිනාකම මෙම වර්ෂයේදී ගිණුම් ගත කිරීමටත්, අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ ඇති වාහනය අළුත්වැඩියාව අවසන් කළ පසු වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමටත් කටයුතු කරනු ලැබේ. වාහන 07 ක් වෙනත් අමාත්‍යාංශ හා ආයතන වෙත විධිමත්ව පවරා දී ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුල ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම සඳහා රු.18,796,073 ක් වැය කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශනවල (ඒසීඒ - 6 ආකෘතියේ) මිල දී ගැනීම් මඟින් අත්පත් කර ගැනීම් යටතේ රු.8,106,936 ක් සටහන් කර තිබීම නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් ශේෂය හා සංචිත ශේෂය රු.10,689,136 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයේ වත්කම් අත්පත් කර ගැනීමේ මුළු වියදම ප්‍රාග්ධනීත කල යුතු වේ. | වර්ෂය තුළ වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද රු.10,345,692 ක වටිනාකම සිගාස් වැඩසටහනෙහි වියදමක් ලෙස ගිණුම් ගත කර ඇතත් වත්කමක් ලෙස ගිණුම් ගත වී නොමැති අතර, 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. තවද විමසුමේ සඳහන් පරිදි වර්ෂයේ මිළදී ගත් වත්කම්වල වටිනාකම රු.343,443 ක් අඩුවෙන් වාර්ෂික වත්කම් වාර්තාවේ පෙන්නුම් කළද 2019 දෙසැම්බර් 31 දිනට නිවරදි අවසන් ශේෂය වත්කම් වාර්තාවේ දැක්වේ. |

### 1.6.2 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1998 වර්ෂයේ සිට නොපියවූ රු.4,809,450 ක අග්‍රිම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් හා ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. | නොපිය වූ අග්‍රිම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතු වේ. | 1998 වර්ෂයේ සිට නොපියවූ අග්‍රිම ශේෂය රු.4,809,450 ක වටිනාකම ඉදිරියේ දී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.3 ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛණය ද මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛණය ද පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛණ පවත්වා ගත යුතු වේ. | දැනට පවත්වා ගෙන යනු ලබන හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීන කර ඉදිරියේදී පවත්වාගෙන යාමට පියවර ගනු ලැබේ. ඉදිරියේදී බැරකම් ලේඛණයක් යාවත්කාලීනව පවත්වාගෙන යාමට පියවර ගනු ලැබේ. |

### 1.6.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් 06 කට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | නියැදි විගණන පරීක්ෂණයට තෝරාගත් වාහන 20 ක ඉන්ධන දහන පරීක්ෂාව චක්‍රලේඛය ප්‍රකාරව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම අමාත්‍යාංශයේ සියළුම වාහන සඳහා ඉන්ධන තුලන පරීක්ෂාව රා.ප.ච 30/2016 ප්‍රකාරව සිදු කිරීම සඳහා කමිටුවක් පත් කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලස්ම පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | රා.ප.ච.2/2018 අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුමක් හෝ ඒ අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොමැති වුවද සෑම තනතුරකටම අදාල නිලධාරීන් සඳහා විවිධ පුහුණු වැඩ සටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අතර දැනට මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් සකස් කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 2 ක් සඳහා 2018 වර්ෂයේ දී එකතුව රු. මිලියන 11.65 ක ප්‍රතිපාදන ද, 2019 වර්ෂයේ එකතුව රු.මිලියන 12 ප්‍රතිපාදන ද වෙන්කර ගෙන තිබුණත් ශ්‍රී ලංකා වාණිජ සමථ මණ්ඩලය අක්‍රියව පැවති බැවින් ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඇස්තමේන්තු සකස් කරන බැවින් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් අදාල කාලය තුල ඉටු කිරීමට ආයතනය කටයුතු කළ යුතු වේ. | ශ්‍රී ලංකා වාණිජ සමථ මණ්ඩලය 2016 වර්ෂයේ දී අධිකරණ අමාත්‍යවරයාගේ විෂය පථයට ඇතුලත් කර ඇත. එහි කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් ලෙස මෙම අමාත්‍යාංශයෙහි හා මුදල් අමාත්‍යාංශයෙහි නිලධාරීන් ඇතුලත් කර ගැනීම බලාත්මක කර ගැනීම සඳහා අවශ්‍ය සංශෝධනයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී ගැටළු පැන නැඟී ඇත. එම නිසා වාණිජ සමථකරණ මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම හා සේවා ලබා දීම ප්‍රායෝගිකව සිදු නොවූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) | 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙන් සමථ මූල මණ්ඩලය සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීමට සැලසුම් කර නොතිබූ නමුත් එම වැය විෂයය යටතේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන් කර ගෙන තිබුණු රු.100,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඇස්තමේන්තු සකස් කරන බැවින් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් අදාල කාලය තුල ඉටු කිරීමට ආයතනය කටයුතු කළ යුතු වේ. | මෙම වැය විෂයෙහි ප්‍රතිපාදන අවශ්‍යතාවය නිශ්චිතවම සඳහන් කිරීමට අපහසු බැවින් වර්ෂය තුල දී මෙම වැය විෂයයන් යටතේ වියදම් දැරීමට අවශ්‍ය වේ යැයි උපකල්පනය කර ප්‍රතිපාදන ඇස්තමේන්තු කරන ලදී. නමුත් වර්ෂය තුල දී වියදම් ඇති නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැඩ තහනමට ලක් වූ නිලධාරීන් තුන්දෙනෙකුගේ ණය ශේෂ එකතුව වූ රු.323,197 ක් වසර 7 සිට 12 දක්වා කාල පරාසයක සිට අය නොවී පැවතුණි. | ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වේ. | නීතිපති දෙපාර්තමේන්තුව මඟින් එක් නිලධාරියෙකුට නඩු පවරා ඇත.එක් නිලධාරීයෙකු නැවත සේවයේ පිහිටුවා ඇතත් සේවය භාර ගෙන ඇති බව තහවුරු කර ගැනීමට නොහැකි වී ඇත. තවදුරටත් සොයා බලා ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරණු ලැබේ.එක් නිලධාරියකුගේ ණය ශේෂය සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) සේවය හැරගිය නිලධාරීන් 4 දෙනෙකුගේ එකතුව රු.301,405 ක් වූ ණය ශේෂ වසර 04 සිට වසර 21දක්වා කාල පරාසයක සිට අය නොවී පැවතුණි | කඩිනමින් අයකර ගැනීම් කළ යුතු වේ. | නිලධාරීන් දෙදෙනකුගේ ණය ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109 යටතේ කපා හැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් යොමු කළත් තොරතුරු ප්‍රමාණවත් නොමැති බව දක්වා ආපසු එවා ඇත. නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 2.3 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 නොවැම්බර් මාසයේ පැවති සමථ දිනය වෙනුවෙන් දරන ලද වියදම් පියවීම සඳහා UNDP ව්‍යාපෘතියෙන් 2017 මාර්තු 22 දින ලැබී තිබුණු රු.1,316,041 ක් සහ 2015 සිට 2017 දක්වා තැන්පත් වර්ග 03 කට අදාලව ලැබී තිබුණු එකතුව රු.1,996,949 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ලැබුණු මුදල් අදාල කාර්යයට යෙදවිය යුතු අතර එසේ නොවේ නම් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහල් 02 කින් යුතුව පුත්තලම නීති ආධාර හා ප්‍රජා විශෝධන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය 2010 සැප්තැම්බර් 15 දින බාහිර පාර්ශවයකට රු.5,583,770 ක කොන්ත්‍රාත්තු වටිනාකමකට පිරිනමා තිබුණු අතර 2011 මාර්තු 27 දින වැඩ අවසන් කල යුතුව තිබුණි. එහෙත් 2019 ඔක්තෝබර් 04 දින වන විටත් වැඩ අවසන් නොකර ඉදිකිරීම් අතරමග නතර කර තිබුණි. ඉදිකිරීම් අවසන් කිරීම සඳහා 2014 වර්ෂයේ දී ද වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.මිලියන 5 ක් වෙන්කර තිබුණත්, එම වර්ෂය තුල ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රජා විශෝධන වරදකරුවන් උපදේශනයට ලක් කිරීම හා කාර්යාල කටයුතු කිරීම සඳහා වෙනම කාර්යාලයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කඩිනමින් වැඩ අවසන් කරගත යුතු වේ. | කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ වැඩ අතරමග නවතා ඇති බැවින් මේ වන විටත් වැඩ අවසන් වී නොමැත. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අතරමග නැවැත්වීම හේතුවෙන් 2014 වාර්ෂික ඇස්තමේන්තුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන උපයෝජනය නොවී ඇති බව වාර්තා කරමි. දෙමහල් ගොඩනැගිල්ලේ බිම් මහලේ වැඩ අවසන් කර එහි නීති ආධාර කාර්යාලය පවත්වාගෙන යයි. |

**3.2 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ වාහන වට්නාකමට ඇතුළත්ව ඇති වාහන 22 ක්, 2018 වර්ෂයේ දී ද, වාහන වට්නාකමට ඇතුලත්ව නැති වාහන 03 ක් 2019 වර්ෂයේ දී ද වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දී තිබුණ ද, ඒවායේ අයිතිය විධිමත්ව පවරා දී නොතිබුණි. | අයිතිය විධිමත්ව පවරා දිය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | වාහන 05 ක් මාස 8 සිට වසර 1 ½ ක කාල පරාසයක් තුල නිශ්ක්‍රීයව තිබූ අතර එයින් වාහන 03 ක වට්නාකම් අමාත්‍යාංශයේ වාහන වට්නාකම් වාර්තාවට ද ඇතුලත් කර නොතිබුණි. | අලුත්වැඩියා කර පාවිච්චියට ගත හැකි වාහන අලුත්වැඩියා කිරීමටත්, පාවිච්චියට ගත නොහැකි වාහන අපහරණය කිරීමටත් කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | නියෝජ්‍ය ඇමැතිවරයාගේ රාජකාරි කටයුතු සඳහා භාර දී තිබූ කැබ් රථයක් 2017 මාර්තු 08 දින අනතුරකට පත් වී තිබුණු අතර එදින සිට බාහිර ස්ථානයක රඳවාගෙන තිබී වසර 02 මාස 06 දින 20 (දින 930) කට පසු වෙනත් වාහනයක පටවාගෙන අධිකරණ අමාත්‍යාංශ භූමියට 2019 සැප්තැම්බර් 28 දින ගෙනවිත් දමා තිබුණි. නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ධූර කාලය 2018 ඔක්තෝබර් 27 දිනෙන් අවසන් වී තිබුණ ද, එම කාලයේ දී වාහනය භාර ගැනීමට අපොහොසත් වී තිබුණි. අනතුර සම්බන්ධයෙන් 2017 ජුනි 07 දින පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව 2019 දෙසැම්බර් වන විටත් ඉදිරිපත් කර නොතිබුණු අතර වාහනය අලුත්වැඩියා කිරීමට ද කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණ කඩිනමින් අවසන් කල යුතු වන අතර අමාත්‍යාංශය සතු වත්කම් ආරක්ෂා කර ගැනීමට ද කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 මැයි 06 දින අනතුරකට පත් වී තිබුණු මෝටර් රථයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(අ) ප්‍රකාර 2019 නොවැම්බර් 29 දිනය වන විටත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. | අදාල පරීක්ෂණයන් කඩිනමින් පැවැත්විය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | අධිකරණ අමාත්‍යාංශය විසින් භුක්ති විඳින නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි පර්චස් 75 ක ඉඩම හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිහිටා ඇති ගොඩනැගිල්ලේ ඉඩම යන ඉඩම් කොටස් දෙකෙහි හිමිකම් ඔප්පු, අනුරේඛන පිටපත්, පැවරුම් සහතික නොතිබීම නිසා වටිනාකම් තක්සේරු කර ගැනීමට නොහැකිව තිබුණි. | නිත්‍යානුකූල ලියවිලි ලබා ගැනීමට හා වටිනාකම් තක්සේරු කර ගැනීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඊ) | වාහන 17 ක ප්‍රවාහන අංශයේ වාහන ලේඛණයේ සඳහන් රක්ෂණ වටිනාකමට වඩා අඩු වටිනාකමක් 2019 දෙසැම්බර් 31 දිනට සිගාස් වාහන වත්කම් වාර්තාවේ ඇතුලත් කර තිබුණි. | නිවැරදි වාහන වටිනාකම් හඳුනාගෙන ඇතුලත් කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.56,139,450 ක් වූ නොපිය වූ අග්‍රිම ශේෂයෙන් වර්ෂය තුල කපාහැර තිබූ රු.51,330,000 ක් පොත් වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 6 වගන්තිය අනුව අදාල ආකෘතියේ තොරතුරු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | අග්‍රිම ශේෂයෙන් වර්ෂය තුළ කපා හැර තිබූ රු.51,330,000 ක මුදල පොත් වලින් කපා හැරීම පිළිබද ප්‍රකාශයේ සටහන් කිරීම මග හැරී ඇත. ඉදිරියේදී නැවත මෙවැනි තත්ත්වයන් ඇති නොවන ආකාරයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදි. |

## 3.4 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානය ස්ථිර ස්ථානයක ස්ථාපිත කරන තෙක් 2013 වර්ෂයේ සිට කුලී පදනම මත ලබාගත් ස්ථානයක පවත්වාගෙන ගොස් තිබූ අතර 2019 ජනවාරි සිට ජූනි දක්වා රු.මිලියන 18.82 ක කුලියක් ගෙවා තිබුණි. මෙම මධ්‍යස්ථානය 2016 දෙසැම්බර් මාසයේදී ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ස්ථාපිත කර ඇති නමුත් සමාගමට අවශ්‍ය මූලධනය සපයාදීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොමැතිවීම හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොමැති වීම යන හේතු නිසා එම සමාගම අක්‍රීයව පැවතුණි. මේ අනුව 2013 වර්ෂයේ සිට වසර 06 ක් ගත වී තිබුණත් මෙම මධ්‍යස්ථානය ස්ථිර ස්ථානයක පිහිටුවීමට අපොහොසත් වී ඇති අතර පිහිටුවන ලද සමාගමද අක්‍රීය වීම නිසා 2019 වර්ෂයේ ගෙවන ලද රු.මිලියන 18.82 ක කුලිය අනාර්ථික ගණුදෙනුවක් වී තිබුණි.2019 ජූලි මාසයේ සිට මෙම මධ්‍යස්ථානය අධිකරණ අමාත්‍යාංශය යටතේ වන කාර්ය භාරයෙන් ද ඉවත් කර තිබුණි. | මෙම පරිපාලන ගැටළුව කඩිනමින් නිරාකරණය කර ගැනීමටත් මුදල් අරපිරිමැස්මෙන් උපයෝජනය කිරීමටත් කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද එක් විගණන විමසුමකට ද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද විගණන විමසුම් 05 කට ද පිළිතුරු 2020 අගෝස්තු 27 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 155 හා 452 (1) සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඉ) වගන්තිය අනුව කටයුතු කළ යුතු වේ. | මෙම විගණන විමසුම් සඳහා දැනට පිළිතුරු සකස් කරමින් පවතින අතර ඉදිරියේදී පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**3.6 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුත්තලම නීති ආධාර හා ප්‍රජා විශෝධන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා බාහිර කොන්ත්‍රාත්කරුවෙකුට 2010 ඔක්තෝබර් 21 දිනැතිව ගෙවා තිබුණු වැඩ ඇරැඹීමේ අත්තිකාරම් මුදලින් රු.254,691 ක් ද, කාර්ය සාධන ඇපකරයෙන් අයවිය යුතු රු.339,595 ක් ද වශයෙන් එකතුව රු.594,286 ක් අයකර ගෙන නොතිබුණි. එම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් 2017 ජුනි 28 දින සිට 2018 පෙබරවාරි 15 දක්වා අවස්ථා 4 ක දී නීති අංශයෙන් උපදෙස් ඉල්ලා තිබුණත් 2019 ඔක්තෝබර් 04 දින වන විටත් අවශ්‍ය උපදෙස් ලැබී නොතිබුණි. | අයකරගත යුතුව ඇති මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | මෙම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට අවකාශ තිබේද යන්න සලකා බලා ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |
| **(ආ)** | අමාත්‍යාංශය විසින් නඩු තීන්දු සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම 2004 අගෝස්තු 01 දින සිට ආරම්භ කර තිබුණත්, 2019 ඔක්තෝබර් 29 දින වන විටත් එම පරිවර්තන ඒකකය ක්‍රියාත්මකව නොතිබුණි. එමෙන්ම ඒ වනවිට 2004 වර්ෂයේ I වෙළුම සිට 2011 වර්ෂයේ I වෙළුම දක්වා නීති වාර්තා සිංහල භාෂාවට පරිවර්තනය හා සංස්කරණය කිරීමට රු.4,064,441 ක් වැය කර තිබුණත්, ඒවායේ මුද්‍රණ කටයුතු ද අවසන් කර නොතිබුණි. 2004 වර්ෂයේ I වෙළුමෙහි කොටස් 03 ක් දෙවන සෝදුපත් කියවීම සඳහා පිටපතක් ලබා ගැනීමට රජයේ මුද්‍රණාලයට භාරදී තිබුණත් 2019 ඔක්තෝබර් 29 දින වන විටත් ඒවා ආපසු භාරගෙන නොතිබුණි. | අවශ්‍යතාවය හඳුනා ගෙන අදාල කාර්යයන් ක්‍රියාත්මක කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රණය කරන ලද නීති වාර්තා පිටපත් 483 බැගින් අමාත්‍යාංශයේ රඳවාගෙන තිබූ අතර ඒ අනුව 2010 වර්ෂයේ සිට 2016 වර්ෂයේ I වෙළුම දක්වා පිටපත් 66,171 ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව අමාත්‍යාංශයේ රඳවාගෙන තිබීමෙන් ඒවා මුද්‍රණය කිරීම වෙනුවෙන් දරන ලද රු.1,281,512 ක වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | අවශ්‍යතාවය පරිදි මුද්‍රණය කිරීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයෙන් 2019 අගෝස්තු මාසයේ දී අධිකරණ අමාත්‍යාංශයට ලැබී තිබුණු උපකරණ වර්ග 6කින් ඒකක 81 ක් 2019 නොවැම්බර් වන විටත් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ තිබුණි. | අවශ්‍යතාවය ඇති අංශ වලට නිකුත් කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | සමථ මූල මණ්ඩල වල 2017 සිට 2019 දක්වා වසර 3 ක කාලය තුළ ආරවුල්කරුවන් නොපැමිණීම හේතුවෙන් නිරවුල් නොවූ ආරවුල් සංඛ්‍යාව සියයට 25 සිට සියයට 39 දක්වා පරාසයකින් ඉහළ ගොස් තිබුණි. | සමථ මූල මණ්ඩල කෙරෙහි ජනතාවගේ විශ්වාසය ඇති කර කාර්යක්ෂම සේවාවක් ලබා දීමට පියවර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ සමථකරණය පිළිබඳව කටයුතු කරන එකම ආයතනය වන සමථ මණ්ඩල කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට තනතුරු 06 ක කාර්ය මණ්ඩල පුරප්පාඩු 35 ක් පැවතුණි. පුරප්පාඩුව පැවති ලේකම් තනතුරෙහි 2017 ජුනි 12 දින සිට කොන්ත්‍රාත් පදනම මත රාජකාරි ආවරණය කරමින් පැවතුණි. ඉදිරියේ දී ඉඩම් ආරවුල් සඳහා වන සමථ මූල මණ්ඩල හා විදේශ ගත ශ්‍රමිකයින්ගේ පවුල් ආරවුල් සඳහා වන සමථ මූල මණ්ඩල ආරම්භ වීමට නියමිතව ඇතත් ඒවායේ පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොමැත. |